# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/6 - 2018 ජනවාරි මස 15 වැනි සඳුදා - 2018.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/1951 (xiv)

**මෝටර් වාහන පනත (203 වැනි අධිකාරය)**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 8, 14 සහ 30 වන වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2018 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. 2013 පෙබරවාරි මස 08 වැනි දින අංක 1796/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් සංශෝධිත, 2011 සැප්තැම්බර් 09 වන දින අංක 1722/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 2011 මෝටර් වාහන (ගාස්තු) නියෝග පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 3 වන නියෝගයේ (අ) ඡේදයේ (i), (ii), (iii) සහ (iv) වන අයිතම ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(i) මෝටර් වාහනය ආනයනය කිරීමේ දින සිට ;

(ii) අවස්ථාවෝචිත පරිදි, දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද හෝ නිෂ්පාදනය කර එකලස් කරන ලද මෝටර් රථය මිල දී ගත් දින සිට ;

(iii) රජයට හෝ අර්ධ - රාජ්‍ය සංවිධානයකට හෝ ශ්‍රී ලංකා රේගුවට අයත් ලියාපදිංචි නොකළ වාහන වෙන්දේසි කළ දින සිට ; ".

"(2) එහි 6 වැනි නියෝගයේ (2), (3) සහ (4) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(2) ලියාපදිංචි අයිතිකරු විසින් ස්වේච්ඡා වෙන් සිදු කරන පැවරීමක් මත මෝටර් වාහනයක සන්තකය වෙනස් කිරීම සිදුකළ දින සිට දින දාහතරක් ඇතුළත ලියාපදිංචිය සඳහා වූ ඉල්ලීමක් භාර දී නොමැති අවස්ථාවක දී, ගෙවිය යුතු ගාස්තුව ද සමග පසුගිය එක් එක් දිනය සඳහා අතිරේක ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය. මේ නියෝගවල IIIඅ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ගයන් සඳහා එක් එක් පසුගිය දිනය සඳහා ගෙවිය යුතු අතිරේක ප්‍රමාද ගාස්තුව, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය. එසේ වුව ද, උපරිම අතිරේක ප්‍රමාද ගාස්තුව එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව නොඉක්මවිය යුතු ය.


1A - PG 3884 — 507 (2018/01)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) මෝටර් වාහනයේ ලියාපදිංචි අයිතිකරුගේ මරණය සිදු වීම මත වාහනයක සන්තකය වෙනස් කිරීම සඳහා ලියාපදිංචිය සඳහා වන ඉල්ලීමක් එම මරණය සිදු වූ දින සිට දින එකසිය අසූවක් අතුළත භාර දී නොමැති අවස්ථාවකදී, ගෙවිය යුතු ගාස්තුව ද සමග එක් එක් පසුගිය දිනය සඳහා අතිරේක ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය. මේ නියෝගවල IIIඅ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ග සඳහා එක් එක් පසුගිය දිනය වෙනුවෙන් ගෙවිය යුතු අතිරේක ප්‍රමාද ගාස්තුව එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය. එසේ වුව ද, උපරිම අතිරේක ප්‍රමාද ගාස්තුව, එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව නොඉක්මවිය යුතු ය.

එසේ වුව ද, මියගිය ලියාපදිංචි අයිතිකරුගේ තෙස්තමේන්තු නඩු කටයුතු හේතුවෙන් එහි ප්‍රතිඵලයක් ලෙස අධිකරණ නියෝගයක සඳහන් දින සිට දින තිහක් ඇතුළත ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් භාර දී ඇති අවස්ථාවකදී, කිසිදු අතිරේක ප්‍රමාද ගාස්තුවක් අයකරනු නොලැබිය යුතු ය. එවැනි අධිකරණ නියෝගයකින් දින තිහකට පසුව ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් භාර දෙනු ලබන අවස්ථාවේ දී ගෙවිය යුතු ගාස්තුව සමග එක් එක් පසුගිය දිනය සඳහා අතිරේක ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය.

මේ නියෝගවල IIIඅ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ගයන් සඳහා එක් එක් පසුගිය දිනය වෙනුවෙන් ගෙවිය යුතු අතිරේක ප්‍රමාද ගාස්තුව, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය. එසේ වුව ද, එම උපරිම අතිරේක ප්‍රමාද ගාස්තුව එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇත ගාස්තුව නොඉක්මවිය යුතු ය.

(4) රජයට හෝ අර්ධ - රාජ්‍ය සංවිධානයකට හෝ ශ්‍රී ලංකා රේගුවට අයත් වාහනයක් එම විකිණීමේ දින සිට දින එකසිය අසූවක කාලයක් ඇතුළත විකිණීමෙන් පසුව ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් භාර දෙනු ලැබිය යුතු ය. එම වාහනය විකුණු දින සිට දින එකසිය අසූවකට පසුව ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් භාර දෙනු ලබන අවස්ථාවක දී, ගෙවිය යුතු ගාස්තුව ද සමග එක් එක් ප්‍රමාද වූ දිනය සඳහා අතිරේක ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය. මේ නියෝගවල IIIඅ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වාහන වර්ග සඳහා එක් එක් පසුගිය දිනය වෙනුවෙන් ගෙවිය යුතු අතිරේක ප්‍රමාද ගාස්තුව එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය. එසේ වුව ද, එම උපරිම අතිරේක ප්‍රමාද ගාස්තුව එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව නොඉක්මවිය යුතු ය.'' ;

(3) එහි 11 වන නියෝගයේ (ආ) ඡේදයට ඉක්බිතිවම (ආආ) ඡේදය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

''(ආආ) කොඩ්‍රිසයිකලය සඳහා රුපියල් දහසක් විය යුතු ය''

(4) එහි I වන උපලේඛනයේ :

(අ) ''ආබාධිතයන් සඳහා වූ රථය'' යන වචන වෙනුවට ''ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි 13 සහ 14 වන අයිතම ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *වාහන වර්ගය* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 13. මෝටර් නිවස | 15,000.00 |
| 14. කොඩ්‍රිසයිකලය | 3,000.00 |

'' ;

(5) එහි II වන උපලේඛනයේ :-

(අ) ''ආබාධිතයන් සඳහා වූ රථය'' යන වචන වෙනුවට ''ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය'' යන වචන ආදේශ කිරීමෙන් :-

(ආ) එහි 12 සහ 13 වන අයිතම ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| වාහන වර්ගය | ප්‍රමාද වීමේ කාලය (වඩා වැඩි) | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 12. මෝටර් නිවස | දින 90 ට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 කට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 කට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 කට වැඩි | 6,000.00<br>7,500.00<br>10,000.00<br>15,000.00<br>25,000.00 |
| 13. කොට්‍රිසයිකලය | දින 90 ට වැඩි එහෙත් අවුරුදු 1 ට අඩු<br>අවුරුදු 1 ට වැඩි එහෙත් අවුරුදු 2 ට අඩු<br>අවුරුදු 2 කට වැඩි එහෙත් අවුරුදු 3 ට අඩු<br>අවුරුදු 3 කට වැඩි එහෙත් අවුරුදු 5 ට අඩු<br>අවුරුදු 5 කට වැඩි | 4,000.00<br>5,000.00<br>6,000.00<br>7,000.00<br>8,000.00 '' ; |

(6) එහි III වන උපලේඛනයේ :-

(අ) ''ආබාධිතයන් සඳහා වූ රථය'' යන වචන වෙනුවට ''ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහනය'' යන වචන ආදේශ කිරීමෙන් :-

(ආ) එහි 19 සහ 20 වන අයිතම ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබිය යුතු ය :-

''

| I වන තීරය | II වන තීරය | III වන තීරය | I වන තීරය |
|---|---|---|---|
| වාහන වර්ගය | සාමාන්‍ය පදනම මත ගාස්තුව (රු.) | ප්‍රමුඛතා පදනම මත ගාස්තුව (රු.) | එක්දින සේවා පදනම මත ගාස්තුව (රු.) |
| 19. මෝටර් නිවස | 2,500.00 | 3,250.00 | 3,750.00 |
| 20. කොට්‍රිසයිකලය | 600.00 | 750.00 | 1,250.00 '' ; |

(7) III වන උපලේඛනයට ඉක්බිතිව ම IIIඅ උපලේඛනය වශයෙන් පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කිරීම :-

'' IIIඅ වන උපලේඛනය

අලුත් අයිතිකරු ලියාපදිංචි වීම ප්‍රමාදවීම

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| වාහන වර්ගය | දිනකට ප්‍රමාද ගාස්තුව (රු.) | උපරිම ප්‍රමාද ගාස්තුව (රු.) |
| 1. මෝටර් රථය | 100.00 | 100,000.00 |
| 2. ද්විත්ව කාර්ය වාහනය | 100.00 | 100,000.00 |
| 3. ඉඩම් වාහනය - (කෘෂිකාර්මික) | 50.00 | 50,000.00 |
| 4. ඉඩම් වාහනය - (කෘෂිකාර්මික නොවන) | 100.00 | 100,000.00 |
| 5. ඉඩම් වාහනය - (රෝද හතරේ ට්‍රැක්ටරය) | 50.00 | 50,000.00 |
| 6. අත් ට්‍රැක්ටරය | 25.00 | 25,000.00 |
| 7. මෝටර් සයිකලය | 50.00 | 50,000.00 |
| 8. මෝටර් ට්‍රයිසිකලය | 50.00 | 50,000.00 |
| 9. මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය | 50.00 | 50,000.00 |

IIIඅ වන උපලේඛනය

අලුත් අයිතිකරු ලියාපදිංචි වීම ප්‍රමාදවීම

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* |
|---|---|---|
| *වාහන වර්ගය* | *දිනකට ප්‍රමාද ගාස්තුව (රු.)* | *උපරිම ප්‍රමාද ගාස්තුව (රු.)* |
| 10. මෝටර් ලොරිය | 100.00 | 100,000.00 |
| 11. මෝටර් ලොරිය - (ෆෝක් ලිෆ්ට්) | 100.00 | 100,000.00 |
| 12. මෝටර් ලොරි - (ප්‍රයිම් මූවර්) | 100.00 | 100,000.00 |
| 13. මෝටර් කෝච් | 100.00 | 100,000.00 |
| 14. ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන වාහන | 25.00 | 25,000.00 |
| 15. මෝටර් ගිලන් රථය | 100.00 | 100,000.00 |
| 16. මෝටර් අවමංගල රථය | 100.00 | 100,000.00 |
| 17. ලොරි ට්‍රේලරය | 100.00 | 100,000.00 |
| 18. ට්‍රැක්ටරය / ට්‍රේලරය | 50.00 | 50,000.00 |
| 19. මෝටර් නිවස | 100.00 | 100,000.00 |
| 20. කොඩ්‍රිසයිකලය | 50.00 | 50,000.00 |
| 21. විශේෂ කාර්ය වාහනය | 100.00 | 100,000.00 ” ; |

(8) එහි V වන උපලේඛනයේ II වන කොටසේ, 4 වන අයිතමයට ඉක්බිතිවම එම උපලේඛනයේ 5 සහ 6 වන අයිතම ලෙස බලපැවැත්විය යුතු පහත දැක්වෙන අයිතම ඇතුළත් කිරීමෙන් :-

| *I වන තීරය* | *II වන තීරය* | | | *III වන තීරය* |
|---|---|---|---|---|
| *වාහන වර්ගය* | *දළ බර* | | | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| 5. මෝටර් නිවස | (අ) | (i) | කි. ග්‍රෑ. 1,000 දක්වා (පෙට්‍රල්) | 2,000.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 1,000 දක්වා (ඩීසල්) | 3,500.00 |
| | (ආ) | (i) | කි. ග්‍රෑ. 1,000 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 1,500 අඩු (පෙට්‍රල්) | 2,200.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 1,000 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 1,500 අඩු (ඩීසල්) | 4,000.00 |
| | (ඇ) | (i) | කි. ග්‍රෑ. 1,500 හෝ ඊට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2000 අඩු පෙට්‍රල් | 2,700.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 1,500 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2,000 අඩු (ඩීසල්) | 4,200.00 |
| | (ඈ) | (i) | කි. ග්‍රෑ. 2,000 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2,500 අඩු (පෙට්‍රල්) | 3,100.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 2000 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2,500 අඩු (ඩීසල්) | 5,500.00 |

| *I වන තීරය* | *II වන තීරය* | | | *III වන තීරය* |
|---|---|---|---|---|
| *වාහන වර්ගය* | *දළ බර* | | | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| | (ඉ) | (i) | කි. ග්‍රෑ. 2,500 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,000 අඩු (පෙට්‍රල්) | 4,200.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 2,500 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,000 අඩු (ඩීසල්) | 9,000.00 |
| | (ඊ) | (i) | කි. ග්‍රෑ. 3,000 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3,500 අඩු (පෙට්‍රල්) | 10,000.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 3,000 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3500 අඩු (ඩීසල්) | 10,000.00 |
| | (උ) | (i) | කි. ග්‍රෑ. 3,500 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 4,000 අඩු (පෙට්‍රල්) | 12,000.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 3,500 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 4,000 අඩු (ඩීසල්) | 12,000.00 |
| | (ඌ) | (i) | කි. ග්‍රෑ. 4,000 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 4,500 අඩු (පෙට්‍රල්) | 15,000.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 4,000 හෝ ඊට වැඩි එහෙත් කි. ග්‍රෑ. 4,500 අඩු (ඩීසල්) | 15,000.00 |
| 6. කොඩ්‍රිසයිකලය | (අ) | (i) | කි. ග්‍රෑ. 750 දක්වා (පෙට්‍රල්) | 750.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 750 දක්වා (ඩීසල්) | 800.00 |
| | (අ) | (i) | කි. ග්‍රෑ. 750 හෝ ඊට වැඩි (පෙට්‍රල්) | 900.00 |
| | | (ii) | කි. ග්‍රෑ. 750 හෝ ඊට වැඩි (ඩීසල්) | 1,000.00 |

2. මෙම නියෝග 2018 ජනවාරි මස 20 වැනි දින සිට බලපැවැත්විය යුතු ය.

02-30

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.